# ඔබේ අදහස් අපට කියන්න

## පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

### පළාත් පාලන ආයතන නීති සංශෝධනය කිරීම සඳහා යෝජනා කැඳවීම.

252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනත, 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමාලෝචනය කර ඒ සඳහා සංශෝධන නිර්දේශ කිරීම පිණිස
ගරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මැතිතුමා විසින්
නීතිඥ සාලිය පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර තිබේ.

එකී කමිටුව වෙත යථෝක්ත නීති සංශෝධනය කිරීම සඳහා පහත ශීර්ෂ යටතේ ස්වකීය ලිඛිත යෝජනා ඉදිරිපත් කරන ලෙස සියළුම දේශපාලන පක්ෂ, මහජන නියෝජිතයින්, රජයේ නිලධාරීන් සහ මහ ජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

1. තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන්ට එරෙහිව පවත්නා විනය ක්‍රියාමාර්ග
2. මූල්‍ය කටයුතු හා ආදායම් උත්පාදනය
3. පාරිසරික හා මහජන සෞඛ්‍යය
4. මහජන උපයෝගී සේවා
5. ස්ථාවර කමිටු සඳහා පුරවැසි සහභාගීත්වය
6. ප්‍රදේශයේ සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරීත්වය
7. ටෙන්ඩර් පටිපාටි ඇතුළත්ව පළාත් පාලන ආයතනයන්හි දූෂණය පිටුදැකීම සඳහා වන ක්‍රියාවලිය
8. පළාත් පාලන ආයතන හා සම්බන්ධ අනෙකුත් නීති ඒකාබද්ධ කිරීම
9. පළාත් පාලන ආයතනවල බලතල, කාර්යයන් හා ක්‍රියාකාරීත්වය
10. ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය හා සංවර්ධන සැලැස්ම
11. වැරදි හා ඒ සඳහා දඬුවම් ලබාදීමේ ක්‍රියාමාර්ග
12. වෙනත් යෝජනා

යෝජනා එවියයුතු පිළිවෙල

* ශීර්ෂ කිහිපයක් යටතේ යෝජනා ඉදිරිපත් කරයි නම් ඒ සඳහා වෙන් වෙන්ව කොළ භාවිතා කරන්න.
* එක් කොළයක එක් පැත්තක් පමණක් භාවිතා කරන්න.
* සරලව, පැහැදිලිව, නිරවුල්ව හා කෙටියෙන් ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.
* ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ 'පළාත් පාලන නීති සංශෝධනය සඳහා යෝජනා'යනුවෙන් සඳහන් කරන්න.
* සියළුම ලිඛිත යෝජනා 2016 මාර්තු මස 09 වන දිනට ප්‍රථම පහත ලිපිනයට තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් මගින් යොමු කරන්න.

**එච්.ටී. කමල් පත්මසිරි**
**ලේකම්**
**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**
**අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02.**

legal@pclg.gov.lk

**අවශ්‍ය විමසීම්**
**011 2302720**